# FORWARD®

## සටන් කරන කාරුණ්‍යයට

2020 දෙසැම්බර්
ISSN 25792369
*e*paper



# වසංගත රෝග විශේෂඥයන්ගෙන් සැදුම්ලත් covid මර්දන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුයි...



සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියානු කලාපීය උපදේශක, ප්‍රජා වෛද්‍ය විශේෂඥ

නිහාල් අබේසිංහ

## වසංගතයක් යනු කුමක්ද?

බෝවෙන හෝ බෝනොවන රෝග සාමාන්‍යයෙන් වාර්තා වන ප්‍රමාණයට වඩා වැඩිවීමක් සහිතව වාර්තා වන පසුබිමක් සෞඛ්‍ය විද්‍යානුකූලව වසංගතයක් ලෙස හඳුන්වනු ලබයි. මීට කලින් බෝනොවන රෝග අධිකව වාර්තාවීම වසංගත රෝග තත්වයක් ලෙස නොසැලකූ අතර මෑතක සිට බෝනොවන රෝග පවා අසාමාන්‍ය ලෙස වාර්තාවීම වසංගත රෝග තත්වයක් ලෙස සලකනු ලබයි.

## වසංගත රෝග පාලනය කිරීමේ මූලික පියවර මොනවාද?

වසංගත රෝග පාලනය කිරීමේදී බෝවෙන රෝග සහ බෝනොවන රෝග පාලනය කිරීමේ ක්‍රමවේද වෙන වෙනම තිබෙන අතර බෝනොවන රෝග පාලනය කිරීමේදී අනුගමනය කරනු ලබන්නේ රෝගියාගේ ජීවිතය විවෘත වන අවදානම් සාධක වලින් හැකිතරම් ඈත්කිරීම සහ රෝගය පැතිරෙන පාරිසරික සාධක ඉවත් කිරීමයි. බෝවෙන රෝග පාලනය කිරීමේදී රෝගවාහකයා හා රෝගියා සහ පරිසරය යන සාධක නිවැරදිව හඳුනාගනී. මෙහි රෝගකාරක ලෙස හැඳින්වෙන්නේ ජීවීන් කොටස්ය. බොහෝවිට මොවුන් වෛරස හෝ බැක්ටීරියා ලෙස හඳුනාගත හැක. ඊළඟට මෙම වසංගත ආසාදනය වන ජන කණ්ඩායම් ඉතාමත් නිවැරදිව හඳුනාගැනීම කළ යුතුය. බොහෝ බෝවෙන රෝග ජන සංයුතිය අනුව පැමිණිය හැක. සමාජයෙන් කඩිනමින්ම මෙම බෝවෙන රෝගයට ලක්වූ වයස් කාණ්ඩය වෙන් කළ යුතුය. එහිදී අප කරනු ලබන්නේ නිවැරදි ප්‍රතිකාර ක්‍රමයක් සොයාගන්නා තුරු රෝගියා ජනතාවගෙන් වෙන්කර තබාගැනීමය. මෙහිදී රෝගියෙකුගෙන් තවත් පුද්ගලයකුට රෝගය වහනය වීමට ඇති ඉඩකඩ ඇහිරීම සිදුකරනු ලබයි. ඒ වගේම සමහර බෝවන රෝග පැතිරී යන පරිසරයද පැහැදිලිව හඳුනාගෙන එම පරිසර සාධකද ඉවත් කළ යුතු අතර රෝගය පැතිරෙන පාරිසරික සාධක වෙනස් කළ යුතුය. ඒ වගේම රෝගය වළක්වාගැනීම සඳහා මුව ආවරණ පැළඳීම නිතර නිතර අත් සේදීම සමාජ පරතරය තබා ගැනීම ඉතා වැදගත්ය.

## වසංගත රෝග පාලනය කිරීමේදී ඇති අභියෝග මොනවාද?

වසංගත රෝග තත්වයක් පාලනය කිරීමට ඇති ප්‍රධානම අභියෝගය නම් ඒ වනවිට වසංගතයට නිසි ප්‍රතිකාර ක්‍රමයක් නොමැතිවීමයි. එනම් මේ සඳහා අවශ්‍ය වන නිවැරදි සෞඛ්‍යය ක්‍රමවේදයක් මත පිහිටා ඇති මානව ප්‍රතිශක්තිකරණ වැඩිකර හැකි එන්නතක් හෝ වෙනත් ප්‍රතිකාර ක්‍රමයක් නොමැතිවීමයි. ඒ වගේම නිවැරදි සෞඛ්‍යය ක්‍රමවේද ක්‍රියාත්මක නොවීමද උදාහරණ ලෙස මුව ආවරණ පැළඳීම, නිතර අත් නොසේදීම, සමාජ දුරස්ථභාවය පවත්වා නොගැනීම යන කාරණා හඳුන්වා දිය හැක.

## ලංකාවේ වසංගත තත්වයේ අවස්ථාව මොන වගේද?

මීට මාස 6කට 7කට පෙර පළමු covid-19 රැල්ල එනවිට අප රටට ජදඩසා පැතිරීමේ අවදානම පැවතියේ විදේශයන්හි සිට එන රෝගින්ගෙන්ය. එය සංචරණ සීමාකිරීම තුළින් වැළැක්විය හැකිව තිබිණ. එහෙත් මෑතක සිට පොකුරු වශයෙන් පැතිරෙන අවස්ථාවන් ලෙස දක්නට ලැබුණු අතර දැන් පොකුරු අවස්ථාවෙන්ද බැහැරවී සමාජය දක්වා පැතිරී යන අවස්ථාවක් තත්වයකට පත්වී ඇත.

## දියුණු යැයි පවසන ලෝකයට මෙම වසංගත තත්වයන්ට මුහුණදිය නොහැක්කේ ඇයි?

ප්‍රධාන ලෙසම පැමිණෙන ඕනෑම වසංගතයක් මුල් අවධියේම හඳුනාගත යුතු අතර එවැනි තත්වයකදී පමණක් වසංගතය පාලනය කිරීමට පහසුය. එහෙත් මෙසේ දියුණුය කියන ලෝකයට පවා මෙම වසංගත තත්වයේ මුල් අවධිය හඳුනාගැනීමට නොහැකි විය. දියුණු යැයි කියන ලෝකය මෙම වසංගතය මුලින්ම ගණන් නොගත් අතර ඔවුන් මෙය වසංගතයක් ලෙස සලකා ක්‍රියාමාර්ග ගන්නා විට රෝගය සැලකිය යුතු ලෙස පැතිර ගොස් අවසන්ය. මෙවන් දියුණු ලෝකයේ ජීවත්වන ධනේශ්වර ජනතාවගේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ විනෝදය සහ සැප පහසුවය. ඔවුන් සතුව ඉතා හොඳ තත්වයේ රෝහල්, ඖෂධ වර්ග, යන්ත්‍රසූත්‍ර කොතරම් දියුණුව තිබුණද මෙම වසංගත තත්වයන්ට මුහුණදීමේදී ඔවුන් ඉතාමත් අසරණ තත්වයට පත්විය.

## මීට වඩා දරුණු වසංගත ලෝකයේ පැතිරිය හැකිද?

අතීතය පිළිබඳ කරුණු සොයා බලන විට සාමාන්‍යයෙන් වසර සියයකට වරක් ලෝකයේ දරුණු වසංගත පැතිරී යන ආකාරය නිරීක්ෂණය කළ හැක. විශේෂයෙන්ම 1821දී කොලරා වසංගතය නිසා ලෝකෙ මිලියන ගණන් ජනතාවගේ ජීවිත අහිමි විය. ඒ වගේම 1920දී ඇතිවූ ස්පාඤ්ඤ උණ වසංගතය නිසා මිලියන ගණනක ජීවිත ලෝකයට අහිමි විය. නැවතත් සියවසක් ගෙවන මෙම මොහොතේ කොරෝනා වසංගතය විසින් මේ මොහොත වන විටත් ලක්ෂ 12කට වැඩි ජීවිත හානි කර කෝටි 5කට වඩා පිරිසක් වසංගතයේ ගොදුරු බවට පත්වී දියුණු ධනේශ්වර රටවල් වසා තැබෙන තැනට පත් වී අවසන්ය. ඒ නිසා මෙය ලෝකයේ අවසාන වසංගතය නොවන අතර මෙවැනි වසංගත තත්ව අනාගතයේදීත් ඇතිවිය හැක.

## මෙවන් වසංගත ඇතිවන්නේ කෙසේද?

සමහර වසංගත ස්වභාවිකව සිදුවන අතර සමහර ඒවා මිනිසාගේ ක්‍රියාකාරකම් මත කෘත්‍රිමව සිදුවන ක්‍රියාකාරකම් මඟින් පැතිර යා හැකි ය. දැනට තියෙන විද්‍යාත්මක සාක්ෂි අනුව මෙම කොරෝනා වසංගතය ස්වභාවිකව පැතිරුණු එකක් බවට ඒත්තු ගොස් ඇත. එහෙත් අනාගතයේ දී මේ පිළිබඳ කරන පර්යේෂණ තුලින් වඩාත් නිවරදිව එය තහවුරු කරගත හැක.

## වසංගත රෝගවලට මුහුණදීමේදී රටක් ලෙස අප පසුවන්නේ කුමන ස්ථානයකද?

මෙම වසංගතය හමුවේ රටක් ලෙස අප තවමත් නිසි ක්‍රමවේදයන්හි පිහිටා ක්‍රියාත්මක නොවන තත්වයක් පෙනී යන අතර අප බොහෝ කරුණු කාරණා ඉටු කරනු ලබන්නේ වෙනත් රටක සිදුවන ක්‍රියාවන් අධ්‍යයනය කිරීමෙන් බව පෙනී යයි. එහෙත් අප කළ යුත්තේ අපේ රටට ගැළපෙන නිසි ක්‍රමවේදයක් මත පිහිටා ක්‍රියාත්මක වීමයි. මේ සඳහා වසංගත රෝග මර්දනය සඳහා අවශ්‍ය උපදේශක කමිටුවකින් සැදුම්ලත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මකවීම අනිවාර්ය වන අතර ඒ සඳහා වසංගත රෝග විශේෂඥයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් ක්‍රියාත්මකවීම අනිවාර්ය විය යුතුය. එහෙත් අප රට තුළ සියල්ල ක්‍රියාත්මක වනුයේ දේශපාලන බලාධිකාරිය විසින් උපදෙස් දෙන සහ වසංගත රෝග පිළිබඳ නිසි දැනුමක් නැති පුද්ගලයන්ගේ උපදෙස් මත සිටය.

## රටක් ලෙස අපට මෙම වසංගතය පරාජය කළ හැකිද? එය කරනුයේ කෙසේද?

මෙවැනි වසංගත රෝගී තත්වයන්ගේදී වසංගතය පරාජය කළ යුත්තේ කෙසේද කියා ලොව පිළිගත් නිසි ක්‍රමවේදයක් නොමැති අතර

ඉතිරි 05 පිටුවට...

# ජනාධිපති නොවුණානම් සර් අදටත් පොර!

මෛත්‍රීපාල සිරිසේන බලයට පත්වෙලා වර්ෂයක් සම්පූර්ණ වන දිනය සමරනු ලැබුවේ "විජයග්‍රහණයේ සැමරුම" යන ප්‍රධාන තේමා පාඨය මූලික කර ගෙනය. ඔහුගේ කෙරුවාව කෙසේ වුවත් එම තේමා පාඨය ඔහු අසාර්ථක නොවූ බව සමාජයට පෙන්වීය. නොවැම්බර් 16 වැනිදා සර් ජනාධිපති වී වර්ෂයක් සපිරිය. සර් වැඩ්ඩෙක් කියා බලයට පැමිණියද වර්ෂයක් අවසන් වන විට සිදුව ඇත්තේ ඔහු වැඩ්ඩෙක් බව හේතු කාරණා සහිතව ඔප්පුකිරීමට මෙවලම් සෙවීමටය. එනිසා සර්ගේ වර්ෂ පූර්ණයේ තේමාව වූයේ "සර් ෆේල් නෑ" යන්නය. 'කොකාගේ සුදු පේන්නේ ඉගිලෙනකොටය' කියා සමාජ කියමනක් තිබේ. සර්ට අත්වී ඇත්තේද එවැනිම ඉරණමකි.

තමා දේශපාලකයෙකු නොවන බවත්, පක්ෂයකට අයිති නොවන බවත්, රට ගොඩනැගීම වෙනුවෙන් නොබියව තීන්දු-තීරණ ගන්නා බවත්, රටේ විනය හදා නීතිගරුක රටක් හදන බවටත්, සර් සමඟ සෙල්ලම් බැරි බවත් සමාජය තුළ මතයක් හදා බලයට පැමිණි සර්, ඒ කිසිවක් කර කියාගත නොහැකි, කටින් පමණක් වැඩ්ඩෙක් බව ඔප්පු කර පෙන්වීය. එය එසේ වුවත් ජනතාව තවම ඔහු ප්‍රතික්ෂේප කර නැත. නමුත් පෙර තිබූ ලෙන්ගතුකම පළුදු වෙමින් තිබේ. ඔහුගේ කෙරුවාව මුලින්ම පෙන්වූයේ ලේකම්වරයා පත් කිරීමෙන්ය. කිසිම රාජ්‍ය තනතුරකට බඳවා නොගත යුතු යැයි අධිකරණයෙන් තීන්දු කළ පී. බී. ලේකම් කිරීමෙනි. ඔහු පත් වූ මුල්ම පැය කීපයේදීම විනයගරුක රටක් හැදීමේ බලාපොරොත්තුව සෝදා ඇරියේය. විදේශීය ගැති භාවයෙන් ලංකාව මුදවාගන්නට පැමිණි සර් ඊළඟට අත ගැසුවේ කොළඹ නගරයේ වාණිජ වටිනාකමින් ඉහළ ඉඩම් අක්කර ප්‍රමාණයක් චීනයට පවරාදීමටය. එතනින් නොනැවැතී ඔහු ඊළඟ ජනතා බලාපොරොත්තුවත් බිඳ දැමුවේ කෙලින් වැඩකිරීමේ දුබලකම පෙන්වමිනි. සහල් මාෆියාව මර්ධනය කරන්නට සර්ගේ සුවච කීකරු යුද සෙනෙවියෙක් යවන ලද්දේ අවුරුදු තිහකට වඩා සහල් සමඟ ජීවත්වූවෙකු ළඟටය. ඔහු වීවල බරත්, පොත්තේ බරත්, කුඩුවල බරත් දන්නා මහා දැවැන්ත ජාවාරම්කරුවෙකුය. ඔහු මට්ටු කරන්නට යැව්වේ තුවක්කුවෙන් වැඩ පෙන්වූ වැඩකරුවෙකුය. ඩබ්ලිව මට්ටු කරන්න ඔහු ළඟ කිසිම අධ්‍යයනයක් නොවීය. Database එකක් නොවීය. ඩඩ්ලි ළඟ අසරණ වූ සර්ගේ සගයෝ සර්ගේ නිරුවත්භාවය රටට පෙන්වීය. සර්ගේ කෙලින් වැඩකිරීම බල්ලට වැටුණේ සහල්වල පාලන මිල ඩඩ්ලි යෝජනා කළ මිල ලෙස ගැසට් කිරීමෙන් පසුවය.

සර් ලේසියෙන් පසුබසින්නට සූදානම් නැත. සර් එක්ක සෙල්ලම් බෑ යන්න ඔප්පුකරන්නට සර් කිසිවෙකුට නොදන්වා මාධ්‍යයට පමණක් දන්නවා සහල් තොග වෙළඳුන්ගේ කඩවලට ගියේය. 'හාල් අඩුවට දෙන්න' යැයි කීවේය. තොග



හිමියෝ එය ගණන් නොගත්හ. ඊළඟට රාජ්‍ය ආයතනවලට හදිසියේම මාධ්‍ය සමඟ පැන්නේය. ආයතන නිලධාරීන්ට බැණ වැදුණේය. 'මිනිස්සු රස්තියාදු නොකරන සිස්ටම් එකක් ඉක්මණට හදලා දෙන්න' යැයි කෑ මොර ගා සර් ආපසු ගියේය. නමුත් හැදුණු වැඩපිළිවෙළක් නම් තවම නැත. එසේම සර් මහබැංකුවට පැන්නේය. නිලධාරීන්ට බැන්නේය. 'කොන්දේසි ලිහිල් කර ණය දෙන්න' යැයි කීවේය. නිලධාරීන් ළහි ළහියේ වැඩ කළෝය. රෑද ලයිට් පත්තු වුණේය. නමුත් ලිහිල් කරන ලද ණය වාසිය ජනතාවට හිමි නොවුණේය. අවසානයේ ජනතාව ගොනාට අන්දවා සර්ගෙ කෙරුවාවේ තරම පෙන්වීය.

සර් ඊළඟට වීර වික්‍රමාන්විතයකට බැස්සේය. තිස් අවුරුදු යුද්ධයක් ඉවරකරන්න පුළුවන් වුණු මට කොරෝනා ඉවරකිරීම මහ කජ්ජක්දැයි පුරසාරම් දෙඩුවේය. නමුත් පටන් ගත් තැනම සිට වැඩේ අවුල් කර ගත්තේය. නියම වෙලාවට ගත යුතු තීන්දු තීරණ නොගත්තේය. මැතිවරණය පැවැත්වීම ප්‍රමුඛව කළේය. Corona උවදුරින් ජනතාව ගලවාගැනීම දෙවැනි විය. මැතිවරණ කොමසාරිස් නොහිටින්න රට කොරෝනාවලින් කොයිබට යයි දැයි කියා හිතාගන්නටවත් බැරිය. මිනිස්සු මැතිවරණ කොමසාරිස්ට ස්තූති කළහ. නමුත් සර්ට බැණ නොවැදුණහ. 'කොරෝනා ලංකාවෙන් තුරන් කළාය, ලෝකයේ දෙවනියට හොඳටම කොරෝනා මර්ධනය කළේ ලංකාවය' යැයි උදම් වැනුවේය. එය මැතිවරණ තුරුම්පුව කරගත්තේය. ජනතාවද සර් වැඩේ හරියට කළා යයි විශ්වාස කළමුත් දෙගිඩියාවෙන් තම අදහස් ප්‍රකාශ කළෝය.

සැප්තැම්බර් මාසය වන විට සර්ගේ කොරෝනා වීරත්වයේ සළුපිළි ලිහුණි. බ්‍රැන්ඩික්ස් පොකුර හමුවිය. ධීවර වරායන්වලට වෛරසය ව්‍යාප්තව තිබිණි. රෝගීන් එන්න එන්නම වැඩිවෙන්නට විය. දැන් දැන් රට පාලනය කරගත නොහැකි තත්වයකට පැමිණෙමින් තිබේ. සර් ලේසියෙන් වැඩේ ඇතෑරියේ නැත. Coronaවල සමාජ ව්‍යාප්තියක් නොමැතිබව ප්‍රකාශ කළේය. පළමුවෙනි ආසාදිතයන් ගෙදර නිරෝධායන කිරීමට යෝජනා කළේය. එන්න එන්නටම තත්වය නරකය. රෝහල්වලට රෝගීන් ගැනීමද ක්‍රමානුකූලව සිදුනොවේ. වාර්තාවන කොරෝනා මරණද වැඩි සංඛ්‍යාවක් ගෙදරදීම සිදුවේ. ජනතාව කර කියාගත දෙයක් නොහැකිව අසරණව සිටී. දැන් දැන් මෙම රෝගය ව්‍යාප්තවන්නේ ඉතාමත් දුප්පත් ජන කණ්ඩායම් වෙතටය. ඔවුන්ට බේරීමට මඟක්, පිහිටක් දැන් නැත. ඇති හැකි, මුදල් තියෙන බහුතරයක් රෝගයට නිරාවරණය නොවේ. ප්‍රභූ පැලැන්තිය සුරක්ෂිතවීමට අවශ්‍ය සියලු සෞඛ්‍ය ක්‍රියාමාර්ග ගනී. නමුත් දුප්පත් ජනතාවට ඒ අවස්ථාවන් අහිමිය.

ඒ අස්සේ සර්ගේ ගජ මිතුරන්ට කොරෝනා ආදායම් උපයන මාර්ගයක් බවටද පත් කර තිබේ. විදෙස්ගත ශ්‍රමිකයින් ගෙන්වීමට එක් ගජයෙකුටද සෞඛ්‍ය නිර්දේශයක් නොමැතිව තිබියදීත් antigen test kit ගෙන්වීමට එක් ගජයෙකුටද, රෝගීන් නිරෝධායන මධ්‍යස්ථානවලට ගෙනයෑම ලේ ඥාතීන්ටද, නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑමට තම ළඟම hotel හිමියන්ටද සන්තෝසන් ලබාදෙමින් සිටී.

ජනතාව පරිස්සම් නොවුනා යැයි ජනතාවට දොස් පවරමින් සර් ජනතාව මතම වරද පටවමින් සිටී. සර්ගෙ බැරි බැරියාව වසාගන්නට ප්‍රකාශ කළේ 'යුද්ධය නම් මට ඉවර කරන්න පුළුවන්, ඒත් මේ වසංගතයක් මම කොහොම ඉවර කරන්න ද?' කියා ය. සර්ගෙ මතකයත් අවුල් ගොස් ජනතාවට තේරෙන්නට ගත්තේ එතැන් පටන්ය. 'සර් මුලින් කිව්ව එකයි දැන් අදහසයි වෙනස් උනේ වංචනිකකමටද?' යැයි ජනතාවගේ හිත ඇතුලේ කුකුසක් ඇතිවෙමින් තිබේ. ඒ බව සමාජ මාධ්‍ය තුළින්ද දක්නට ලැබුණි. වාහනවල පිටිපස්සේ ගැසූ වැකි ලෙසට පවා ජනතාව සිය අප්‍රසාදය මෙසේ පළකර තිබුණි. "PCR නොකළා නම් අදටත් අපි ලෝකෙන් දෙක, ජනාධිපති නොවුණා නම් සර් අදටත් පොර!"

වර්ෂ පූර්ණය එළඹෙන විට තම පෞරුෂය බිඳවැටී ඇති බව දැනුනු සර් එය නැංවීම සඳහා වැඩසටහනක් හදන්නට යැයි තම ප්‍රොපගැන්ඩා මෙහෙයවන්නන්ට තදින් අවවාද කර තිබුණි. ඔවුන් ඒ සඳහා සූදානම්වෙද්දී රටේ පූජනීය මහා සංඝරත්නයගෙන් ඇප උපස්ථාන, උවටැන් ලබමින් මහා සංඝගත දක්ෂිණාවක් අගමැති ජනාධිපති හා ඔවුන්ගේ ආර්යාවන් ඇතුළුව පිරිස භුක්ති විඳින ඡායාරූපයක් සෝෂල් මීඩියා තුළ viral වෙන්න පටන්ගත්තේය. සර්ගෙ පොරත්වය බේරාදීමට සෝෂල් මීඩියා තුළත්, මාධ්‍ය තුළත් සිය ගෝල බාලයන් උත්සාහ කළත් එය නතර වුණේද හත්පොලේ ගාගෙනය. ඉහත ඡායාරූපය සමාජ මාධ්‍ය තුළට එක් කළ පුද්ගලයාව අපරාධ විමර්ශනයට ගෙන්වා ඡායාරූපය ගත් අයුරුද විමසා තිබේ. එමගින්ද පොරත්වය වෙනුවට සර්ගෙ දුප්පත්කම වැඩි වැඩියෙන් සමාජගත වන්නට විණි. 'ඒ තරම්වත් දෙයක් දරාගන්නට සර්ට බෑ නේද?' යැයි සමාජයේ බොහෝ තැන්වලින් ඇසිණි.

ෆේල් නැති බව වර්ෂයක් ඉක්මයන තැන ඔප්පු කිරීමට සිදුවීමම සර්ගෙ අසාර්ථකත්වයේ තරම කියාපායි. ඔවුන්ගේ ප්‍රොපගැන්ඩා ව්‍යාපාරය පටන් ගත්තේද 'නෑ. සර් ජේල් නෑ!' කියාය. එතනම ඒ ව්‍යාපෘතිය ඇනගත්තේය.

මේ යන විදියට සර්ගෙ 2021 තේමා පාඨය විය හැක්කේ "නෑ සර් ඒ එතරම්ම ෆේල් නෑ" කියා විය හැකිය. 2022දී සර්ගෙ තේමා පාඨය විය හැක්කේ "සර් ටිකක් ෆේල් වුණාට වාටර් නෑ" කියා විය හැකිය. 2023 තේමා පාඨය විය හැක්කේ "සර් කියන තරම් වාටර් නෑ" කියාය. එතනින් එහාට සර්ට මොකක් වේවිදැයි කියා අපටත් සිතාගත නොහැකිය. මොකක් නමුත් අවසාන වශයෙන් කිව හැක්කේ "ජනාධිපති නොවුණානම් සර් අදටත් පොරය" කියාය.

# ජීවිතයට ආදරෙන්! හෙලන්....




ඇය සිනිඳුයි..සුන්දරයි..හැබැයි ශක්තිමත්! සෙල්ශියස් 0 දී ගල්ගැහෙන අයිස්කන්දකටත් වඩා ඇය ශක්තිමත්!!...

කේරළය කියන්නේ දිනෙන් දින ප්‍රගතිශීලී වැඩ පෙන්නන තැනක්.. ඒක සිනමා ක්ෂේත්‍රයටත් අදාලයි.. ලොව පුරා සිනමාලෝලීන්ට අනුව කේරළය එහෙමත් නැත්නම් මලයාලම් සිනමාව කියන්නෙ "මහ පොළොවෙ සිනමාවටයි".. කේරළ සිනමා කෘතිවල දිගහැරෙන අති තාත්වික රංගන ප්‍රතිභාව මෙන්ම ප්‍රගතිශීලී සාමාජයීය වටිනාකමකින් යුතු කතාංග මෙයට හේතුවිය හැකියි... එවන් එක් භාවපූර්ණ, හදවතට ලැදි සිනමා කෘතියක් ගැනයි ෆෝවර්ඩ් අපි අද ඔබට කියන්නේ....

හෙලන්...2019 වසරේ නොවැම්බරයේදී තිරගත වෙන මේ චිත්‍රපටය මුතුකුට්ටි ක්ශේවියර්ගේ අධ්‍යක්ෂණයක් වන අතර නිෂ්පාදනය විනීත් ශ්‍රීනිවාසන්ගේය. තිරයේ දිවෙන විනාඩි 117 පුරාවටම ප්‍රේක්ෂකයාගේ හදවත් සොරාගැනීමට හපන්කම් කියන මේ සිනමා කතාන්තරය ආදරය, සෙනෙහස, ත්‍රාසය, කුතුහලය වගේම සොඳුරු මිනිස්කම් පිරි අතැඹුලක්.. 2020 වසරේදී Critics Choice Film Awardsහිදී හොඳම චිත්‍රපටයට මෙන්ම හොඳම නිළිය, අධ්‍යක්ෂකවරයා හා හොඳම කතාංගය සඳහා යෝජනාවෙන්නේද අන්න ඒ නිසයි..

හෙලන් කියන්නේ මේ කතාවේ කතා නායිකාව. ඇයට තිබුණෙ හරි සාමාන්‍ය, සරල ජීවිතයක්.. ඈ සුන්දරයි.. ඒ වගේම ඇය හෙද උපාධිය සම්පූර්ණ කළ උගත් තරුණියක්. ඇගේ බලාපොරොත්තු වූයේ විදෙස් රටක හෙද සේවයේ නිරතවීමටයි.. නිවසේ ආර්ථිකමය අපහසුතාවන් නිසා එසේ විදෙස්ගතවීමට ඈ සූදානම් වෙන පසුබිමක, ඈට මුහුණදීමට සිදුවන සුවිශේෂ සිද්ධියක් මත තමා මේ කතාව ගොඩනැගෙන්නෙ.. හැබැයි එක භයංකාර කතාවක් ඇතුළෙ අපිට හොඳ කතාන්දර ගොඩක් මතක් කරලා දෙන්න මේ චිත්‍රපටය සමත්වෙනවා...

"තාත්තේ ඔයා සිගරට් බීලා ලෙඩක් හැදුණොත්?..තාත්තෙ මම කැනඩා යනවා.. ඒ ඔයාගෙන් ඈත්වෙලා ඉන්න කැමති නිසා නෙවෙයි.මේ ණය ඉවරකරලා අපි හොඳින් ජීවත්වෙන්න ඕන නැද්ද?..ඒ නිසා මාත් එක්ක ඉන්න.."

ඈ ආදරණීය දියණියක්!.. මවක සේ තම පියාවත් රැකබලා ගන්නා ආදරණීය දියණියක්!!.. විදෙස්ගතවීමට අවශ්‍ය ඉංග්‍රීසි විභාගයකට සූදානම්වන අතරෙ ඒ සඳහා අවශ්‍ය මුදල් උපයාගැනීමට ඈ අර්ධකාලීන රැකියාවක නිරතවෙනවා.. ලොක්කන්ගේ තාඩන පීඩන මැද්දෙ, රෑය පහන්වන තුරුම ඈ එම රැකියාවෙ නිරතවෙන්නේ තම අපේක්ෂා සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් නොපසුබට ධෛර්යයෙන්..!

ඉතින් ඇයට උක්ත කී සුවිශේෂී සිදුවීමට; අකරතැබ්බියකට මුහුණ දෙන්නට වෙන්නෙත් මේ රැකියා ස්ථානයේදීමයි... චිත්‍රපටයේ මුලු ගුවන්කාලය පුරාවටම අපගේ සිත් අරගල කරන්නේ ඈ සමඟයි. ඇගේ ජීවිතයේ ඊළඟ මොහොත සමඟයි.. ඇගේ ජීවිතය බේරාගැනීම වෙනුවෙන් ඈ කරන අනවරත අරගලය සමඟයි.. රංගනය සැසඳීමේදී හෙලන්ගේ චරිතයට විශිෂ්ඨ ලෙස පණපොවන ඇනා බෙන් 2019 CPC Cine Awards" Movie Street Film Awards හා 2020 Vanitha Film Awardහිදී හොඳම නිළිය සඳහා සම්මාන දිනාගැනීම අරුමයක් නම් නොවන බව කාටත් පසක් වනු නොඅනුමානය...

ආත්මාර්ථයෙන් නොහික්මුණු ලෝකයක හුස්ම සමඟ පොරබදින අසීරු අවස්ථාවකදී පවා අන් අයට උපකාර කිරීමේ මානුෂීය ගුණය හෙලන් හරහා මතකයට නංවන්නේ ප්‍රේක්ෂක සිත්සතන් තුළ පහන් හැඟුමක් ජනිතකරවමිනි.

"කව්ද ඒ?"

"ශාහීනා තාත්තේ."

"ඔයාට ඇයි බැරි අපේ මිනිස්සු එක්ක යාලුවෙන්න?.."

"අපේ මිනිස්සු කියල කිව්වෙ?"

"අපි ඉහළ පැලැන්තියෙ ශුද්ධ කතෝලික අය."

"ඔයා මොන පළාතෙද තාත්තෙ ඉන්නෙ?..."

ඇය ආදරණීය මිතුරියක්! පෙම්වතියක්!!..ක්‍රිස්තියානි සම්භවයකින් පැවත ආවද ඇගේ ආදරය හිමිවන්නේ ආසාර්ටය. මිත්‍රත්වයට හෝ ප්‍රේමයට, මිනිස් හැඟීම්වලට ජාතිකත්ව බාධාවක් නොවන වග මෙම කතාව මගින් ගෙනහැරපායි.. එසේම හෙලන් ඇගේ සිනහව, මිත්‍රත්වය බෙදාගත්තේ අතිශයින්ම මනුෂ්‍යත්වය සමඟ විනා කිසිවෙටෙකත් ඔවුන්ගේ සමාජ තරාතිරම් සමඟ නොවේ!..

"මම මේ රස්සාව පටන් අරන් අවුරුදු 30ක් විතර වෙනවා. මම දවසකට මිනිස්සු සියගාණක් දකිනවා. අපි මේ වෙනකන් කතාකරලවත් නැහැ.. ඒත් ඔයාගෙ දුව මාත් එක්ක කිසිම පැකිලීමක් නැතුව හිනාවෙනවා. එයා මට අතවනනවා.. ඇත්තටම අද කාලෙ මිනිස්සුන්ට උගන්නන්න ඕන මූණ දිහා බලාගෙන ඇවිදින්න. බිම බලාගෙන ඇවිදිනවා වෙනුවට!.."

ඉතින් හෙලන්ට මුහුණදීමට සිදුවන ඒ අභියෝගය කුමක් විය හැකිද? ඇය ඒ අභියෝගය කෙසේ නම් ජයගනීවිද?...එන්න! හෙලන්ගේ ජීවිතය දකින්න..ජීවිතයට ආදරෙන්...!!

## සරදියෙල්ගේ කොලම

එක්වරම සරදියල්ට අන්දරේ මතක් උනා. ඒ මොකැයි කියලද හිතන්නේ? අන්දරේ දවසක් රජ වාසලට ඇවිදන් යන කොට, ගමේ කොල්ලෝ එකතුවෙලා පාරට පෙරළිලා තිබ්බ තඩි කලු ගලක් අයින් කරන්න උත්සහා කරනවා. නමුත් ගල හුඟක් විශාලයි. අන්දරේට එක පාර අමුතු අදහස් එන්න ගත්තා. අන්දරේට හිතුණා වීරයෙක් වෙන්න. මොකද කවදාවත් අන්දරේට වීරයෙක් වෙන්න ලැබිලා තිබුණේ නෑ.

එක පාරක් වීරයා වෙන්න හිතාගෙන අන්දරේ තරුණ කාලේ රාජකීය හමුදාවට බැඳිලා පොඩි පට්ටමකුත් ගත්තා. අන්තිමට යුද්ධයක් එද්දි බය වෙච්ච පාර, තමන් පිස්සෙක් කියලා රජාට අඟවලා, බයට පිට දීප දේසෙකට ගොහින් හැංගිලා හිටියේ.

පස්සේ අන්දරේ කපටි සහෝදරයෙක්ගෙ කුමන්ත්‍රණයකින් රජ උනාට පස්සේ තමයි ආයේ රජ වාසලේ වැඩට ආවේ. උඩු රැවුලක් එහෙම දාගෙන වෙස් වලාගෙන. වීරයෙක් විදියට රඟපාගෙන තමයි ආවේ. හැබැයි හක හක ගාලා තමන් කරන විහිළුවලට හිනාවෙද්දි තමයි මිනිස්සු එයාව අඳුන ගත්තේ මේ අන්දරේම තමයි කියලා. හැබැයි හුදී ජනයා මෙයාගේ රඟපෑමට රැවටුණා.

හරි හරි ආයෙමත් කතාවට එමුනේ. අන්දරේ අර ගල ඉවත් කරන්න මහන්සි ගන්න තරුණයන්ට කිව්වා තමා හිටපු යුධ සෙනවියෙක් කියලා.

"මට මේවා සුළු දේවල්. යුද්දේ ඉවර කළෙත් මමනේ. ඒ කරලවත් මම පාරවල් වැහුවේ නෑනේ. මේ කළු ගලක් හින්දා පාර වැහෙන්න දෙන්න බෑ. මම ඕක සුටුස් ගාලා අයින් කරන්නම්."

රජාට ඇන්ද අන්දරේ කටමැත දොඩවන්න ගත්තා. එතන හිටපු තරුණයින්ගෙන් සුළු පිරිසකට නම් තේරුණා මෙයා කයිවාරු කවටයෙක් බව. ඒත් බහුතරේ රැවටුණා. මෙයා බහුතරේට පේන්න එක එක මෝඩ උපක්‍රම යෙදුවා. ගල අයින් කරන්න. ඒත් ඒක හොල්ලන්නවත් බැරි උනා.

මෙයාට රැවටුණ බහුතරේ එකා දෙන්නා පවා මෙයාට බනින්න ගත්තා. පොරට හොඳටෝම නට්ලූස් උනා.

"මං මේක ෂෝක් එකට අයින් කරන්න ගියේ, කොහේද මේ ජනතාව පැනික් උනානේ. ජනතාව තමයි මේකට වගකියන්න ඕනේ."

පොර පිස්සු විකාරෙන් කියවන්න ගත්තා.

"දැන් එතකොට සර් කිව්වා නේද යුද්දේ ඉවර කළා කියලා" අර බහුතරේ පොරගෙන්ම ප්‍රශ්න කළා.

"ඔව් මං තමයි ඉවර කළේ. මේක ඉතිං යුද්ධයක් නෙවෙයිනේ. යුද්ධයක් උනා නම් මං ලේසියෙන්ම ඉවර කරනවා. මේක මේ ඉංජිනේරු ප්‍රශ්නයක්නේ. හැබැයි ඔය ගල උඹලා එකතුවෙලා මගේ කර උඩින් තිබ්බොත් මං අයින් කරලා පෙන්නන්නම්."

හුදී ජනයාට රතු කට්ට පැන්නා. "හූ..... හූ...... තමුසේ වගේ King කෙනෙක් නම් fkdoking"

"තමුසෙට කියන්න ඕනේ Respect sir නෙවෙයි. Upset sir කියලා"

"ටෙනී මැරිච්ච එකේ තමුසේ හොඳයි කොමඩි king කරන්න."

උඩු රැවුල වවාගෙන සර් වෙන්න try කරපු අන්දරේට, අවුරුද්දක්වත් හරියට චරිතේ රඟපාන්න බැරි උනා. සරදියල්ට දුක ඒ ගැන නෙවෙයි.

හුදී ජනයා ඊළඟ පාරවත් පාඩමක් ඉගෙන ගනී ද?

නූතන පරපුරේ සරදියල්

සයිබරයේ සැරිසරමු

# ඔන්ලයින් රැකියාවක් Fiverr Account එකක් හදාගන්නේ කොහොමද?

Inbox එකෙන්, පාරේ තොටේදි මුණගැහුණාම ගොඩක් අය අහන දෙයක් තමයි අපිටත් ඔන්ලයින් වැඩකරලා කීයක් හරි හොයාගන්න බැරිද කියලා. එයිනුත් Fiverr ගැන ගොඩක් අය අහනවා. මේ ඒ අයට.

ලේසි නෑ. අමාරුයි. හැබැයි මහන්සි වෙලා ගොඩදාගත්තොත් කල්ලමරේ!.

ගොඩක් අය දැන් Fiverr එකේ වැඩ කරන්න උත්සාහ කරන නිසා මගේ අවුරුදු 6ක අත්දැකීම් ටිකක් බෙදාගන්න හිතුවේ ගොඩක් කාලයක ඉඳලා. මේ කියන්න යන්නෙ අවුරුදු 6ක එකම Fake order එකක්වත් දාගන්නෙ නැතිව, එකම account එකෙන් මේ වෙනකම් ලබාගත්ත අත්දැකීම්.

මේකයි වැඩේ!. මේ පහළ ටික කරන්න බැරි නම් Fiverr දීර්ඝ කාලීනව කරන්න බෑ. හරියන්නෙත් නෑ.

1. මොකක් හරි ක්ෂේත්‍රයක වැඩ්ඩෙක් වෙන්නම ඕන:

උදාහරණ - Logo design, Video editing, Flyer/Brochure design, website design/developing App, Fiverr එකේ category ටික බැලුව නම් ඔයාට ගැලපෙන දේ හොයා ගන්න පුලුවන්. හැබැයි තව කෙනෙක් ගොඩගිය ක්ෂේත්‍රය ඔයාට බැරිම එක වෙන්න පුලුවන්. ඒ නිසා ඔයාට පුලුවන් එක හොයාගන්න.

2. ඉවසීමෙන් සැනසීම: Fiverr Account එක create කරලා සමහර අයට අනික් පහුවදා ඉඳලම Order එන්න පටන්ගන්න පුලුවන්. සමහර අයට මාසයකින්, අවුරුද්දකින්-දෙකකින් වෙන්නත් පුලුවන්. ඒ වෙනකම් ඉවසන්න පුලුවන් වෙන්න ඕන. Gig වෙනස් කරකර, අලුත් ගිග් දාලා නිතරම මේකේ ඉන්න ඕන. (මේවා ගැන වෙනම ලිපියකින් ලියන්නම්)

Fiverr එකේ Account එකක් Open කරන්න කලින්.....

1. Profile එකට දාන්න හොඳ Photo එකක් හොයාගන්න.

2. හොඳ Portfolio එකක් ඔයාම හදපු සාම්පල්ස් දාලා හදාගන්න. behance, flickr වගේ ඒවා හොඳයි. එන Clientලා ගොඩක් අය Portfolio එකක් ඉල්ලනවා.

3. Profile එකට දාන්න විස්තරයක්. ක්ෂේත්‍රයේ අත්දැකීම්, ලබාදෙන සේවාවේ තත්වය වගේ විස්තරයක් ඇතුළත් කරලා ආකර්ෂණීය එකක් ලියාගන්න ඕන. කඩ්ඩ එච්චර හොඳ නැත්නම් සිංහලෙන් ලියලා කඩ්ඩ පුලුවන් කෙනෙක්ට කියලා translate කරගන්න.

4. Copy නැතිව ඔයාගෙම Cover Image හදාගන්න ඕන ගිග්වලට. Creative and unique වෙන තරමට හොඳයි. එන Clientf.a බොක්ක කූල් වෙන්න මේ සාම්පල් කවර් ටික ඕන.

5. ගිග් එකෙන් ගිග් එකට unique Title හදාගන්න. මේක වැදගත්ම එකක්. මේක ගැන වෙනම එකකින් ලියන්නම්.

6. Copy නැතිව ඔයාගේම description ගිග් එකෙන් එකට මහන්සි වෙලා ලියාගන්න. කඩ්ඩ එච්චර හොඳ නැත්නම් සිංහලෙන් ලියලා කඩ්ඩ පුලුවන් කෙනෙක්ට කියලා translate කරගන්න. මතක තියාගන්න ඕන දේ තමයි මේ අපේ හැකියාව ගැන, අපි දෙන Service එක ගැන සුද්දන්ට කියන්නෙ කියලා. grammar එහෙම වැරද්දුවොත් එතනම රිජෙක්ට්.

7. Price List එකක් හදාගන්න ඕන. ඉස්සෙල්ලම හදන එක නිසා සල්ලි ගැන නෙවෙයි Ratings ගැන තමයි හිතන්න ඕන. Ratings ගැන හිතලා දෙන්න පුලුවන් හැමදෙයක්ම දීලා Client සතුටු කරන එක තමයි මුලින්ම කරන්න ඕන. ඒ නිසා මුලින්ම ලොකු ගණන් කියන්න යන්න එපා. Ratings නැති ගිග් එකකින් ලොකු ගණන්වලට ගන්න තරම් පිස්සුවක් එන අයට නෑනේ!.

දැන් පුලුවන් Account එකක් Open කරන්න....

ගිග් එකක් Publish කරන්න හොඳම වේලාව-

අපේ වේලාවෙන් රෑ 9න් පස්සෙ වගේ Publish කරන්න පුලුවන් නම් හොඳයි. මොකද ඒ ටයිම් එකට තමයි USA අය ඇහැරලා ඉන්නේ. ඒ වේලාවට අපේ ගිග් එක NEW category එකේ උඩම පේනවා. තව අලුත් ගිග් දාන්න දාන්න අපේ ගිග් යට යනවා.

දැන් ඉතිං Fiverr App එක එහෙම දාගෙන, හම්බවෙන Offers ටික එහෙම දාගෙන මේකෙම ජීවත් වෙන්න තියෙන්නෙ Success වෙනකම්. PC එකෙන් පුලුවන් තරම් වේලාවක් Online ඉන්න. App එකෙන් ඉන්නවට වඩා හොඳ වෙන්නෙ PC එකෙන් ඉන්න එක.

දිගින් දිගටම impression එහෙම අඩුවෙන ගිග් අයින් කරලා අලුත් ගිග් දාමු කම්මැලිකම පසෙක තියලා. මේවට තමයි මහන්සි වෙනවා කියන්නෙ!.

Level 01

මම නම් හිතන්නෙ මේක තමයි අමාරුම. මුල් orders ටික දාගන්න, ඊටත් වඩා ඒවා 5 star rate කරගන්න පට්ට අමාරුයි. මොකද මුලින්ම සෙට් වෙන ගොඩක් අය Low Budget කාරයෝ. පට්ට අමාරුයි එයාලා එකක් වැඩ කරන්න. ඒකට ඉවසීම තියෙන්නම ඕන. ඉල්ලන දේවල් ඔක්කොම දීලා හරි ඒ අය සතුටු කරන්න ඕන. orders cancel නම් කරගන්න එපා පුතේ. ඒක හොඳම නෑ!.

Level 02

Level 01 උනා කියන්නෙ ඉතින් ගේම ගහගන්න දන්නවා කියන එක. ඉතින් Level 02 වෙන්න ඔයාට අලුතෙන් දේවල් කියන්න දෙයක් නැහැ. Level 01 උනාට පස්සෙ හෙමින් සැරේ ගණන් ටිකක් එහෙම වැඩිකරලා දෙන සර්විස් එකත් හොඳටම දීලා Clientලව සතුටු කරා නම් Easy වැඩක් level 02 වෙන එක.

වැදගත්-

Client base එකක් හදාගන්න ඕන. නිතරම ඒ Base එක නඩත්තු කරන්න ඕන. සැපදුක් අහන්න ඕන. ළංවෙන්න ඕන, පවුලේ හිතවතෙක් කරගන්න පුලුවන් නම් ඒත් කමක් නෑ. හැබැයි රජෝ private contact details නම් ඉල්ලලා වරද්දගන්න එපා!.

Top rated.

දැන්නම් ලේසියෙන් දෙන්නෙ නෑ. ඒ උනාට ගන්න පුලුවන්. ආඩම්බරයි! ලංකාවේ ගොඩක් Top ratedලා ඉන්නවා දැන්. ඒ තමයි වැඩ්ඩෝ. මේකටත් කැපවීම තමයි ඕන. ඒ වගේම selling average වැදගත්. නිතරම මේක 60ක් උඩවත් තියාගෙන යන එක, service එක සැපටම දෙන එක, කඩ්ඩ, මේවා ඔක්කොම බලපානවා.

උඩ ටික කරන ගමන් මේවත් අමතක කරන්න එපා!!

01. ඒ ටික කරන කොටත් ඔයා වයසට යනවා. ජීවිතේ විඳින්න අමතක වෙයි. ටයිම් තියෙන විදිහට ඇවිදින්න, කෑම වර්ගවල රස බලන්න, අම්මා, තාත්තා ගැන හොයලා බලන්න අමතක කරන්න එපා!.

02. එක තැන ඉඳගෙන ඉන්නකොට, මොනිටර් එකේම ඇස් දෙක තියාගෙන ඉන්නකොට එක එක ලෙඩ එන්න පුලුවන්. පුලුවන් නම් ජිම් එකකට යන්න වෙලාවක් වෙන් කරගන්න. නැත්නම් ඇවිදින්න, දුවන්න, ක්‍රිකට් ගහන්න වගේ ඔයා ආසා කරන ඒවටත් වේලාවක් වෙන්කර ගන්න. නැත්නම් හම්බකරන සල්ලි මදිවෙයි බෙහෙත් වලටම. දැනට ඇති!.



සටහන:
ප්‍රියන්ත දිසානායක

අපගේ ඊමේල් ලිපිනය
Email: syuforwardnews@gmail.com

## වසංගත රෝග...

2 පිටුවෙන්....

වසංගතයේ අවදානම මත වසංගත රෝග පිළිබඳ විශේෂඥයන්ගෙන් සැදුම්ලත් විද්වත් මණ්ඩලයක් විසින් මෙයට නිසි වැඩපිළිවෙළක් සකසාගත යුතුය. එයට අදාලව අප රට ගත යුත්තේ කුමන ක්‍රියාමාර්ගය දැයි තීරණය කළ යුතුය. අපේ රට ගතහොත් වසංගත රෝග පිළිබඳ අත්දැකීම් සහිත විශේෂඥ කණ්ඩායමක් සේවයේ සිටින අතර එම පිරිස ප්‍රමාණවත් නොවන්නේ නම් විශ්‍රාම ගිය වෛද්‍යවරු සහ විශේෂඥ වෛද්‍යවරුන් පවා මෙම වැඩපිළිවෙලට සහභාගි කරගත හැක. ඔවුන්ගේ දැනුම ලබාගැනීමට කිසිදු බාධාවක් නොමැත.

මෙම වසංගත රෝගී තත්වය මර්ධනය කිරීම සඳහා මා යෝජනා කරනුයේ නිසි අධ්‍යයනයක් මඟින් ලැබෙන දැනුම ගොනුකර පෙළගස්වා ක්‍රියාමාර්ග ගත යුතු ක්‍රමවේදයකි. මෙවැනි තත්වයකදී විද්‍යාත්මක කරුණු සමාලෝචනයක් කර ක්‍රියාමාර්ග ගත යුතුය. ඒ සඳහා වසංගත රෝග විශේෂඥයන්, සෞඛ්‍ය කාර්යය මණ්ඩල, ප්‍රජා සෞඛ්‍යය ඒකකයන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, රෝහල් කාර්යය මණ්ඩලය, හෙද නිලධාරින්, ළමා රෝග හා කායික රෝග විශේෂඥයන්, සමාජ විද්‍යාඥයන්, ආර්ථික විද්‍යාඥයන් හා වෛද්‍යවරුගෙන් සැදුම්ලත් විශේෂඥ කණ්ඩායමක් වසංගත රෝග මර්ධන ඒකකයක් ලෙස පිහිටුවා ඔවුන්ගෙන් ලැබෙන දැනුම ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කර මෙම රෝගය මර්දනය කිරීම සඳහා යොදාගත හැක. එහෙත් අවාසනාවකට තවමත් අප පසුවනුයේ එවැනි තත්වයක නොවේ!. අප රටේ දැනටත් මෙම වසංගත රෝගය මර්දනය කිරීම සඳහා උපදෙස් දෙනු ලබන්නේ වසංගත රෝග පිළිබඳ නිසි දැනුමක් නොමැති දේශපාලන අධිකාරිය සහ ඔවුන් වටා සිටින ඔවුන්ගේ මිතුරු කැළය. ඒ වගේම අප රට තුළ සෞඛ්‍යය ක්‍රමවේදයන් පිළිබඳ නොදැනුවත්භාවයද මෙම වසංගත රෝගය මර්දනය කිරීමට බාධාවක් වී ඇත. සමාජ දුරස්ථභාවය තබාගැනීමට නොහැකි වී තිබීම ඉන් එකකි. එහෙත් මෙය සම්පූර්ණයෙන් පරාජය කිරීමට මෙම කාරණා පමණක් ප්‍රමාණවත් නොවන අතර ඉතා කඩිනමින් මේ සඳහා එන්නතක අවශ්‍යතාවයද දැනෙමින් පවතී.



# පරිසරය කාගේද?

පරිසරය කාගේද යන පැනය නිතැතින්ම පැනනඟින්නේ අප රට තුළ දෛනිකව සිදුවන වනවිනාශය නිසාය. මේ විනාශය කොතෙක්ද යත් දැනට අපේ වනසම්පතින් ඉතිරිව ඇත්තේ 17%ක් වැනි කුඩා පංගුවකි. දෛනිකව විනාශකරමින් පවතින්නේ මේ ඉතිරිව ඇති කුඩා පංගුවයි. මිනිසුන් ජීවත්වීමේ අරගලය සමඟ පොරබැදීමේදී වනවිනාශයට දැනුවත්ව හෝ නොදැනුවත්ව දායක වන්නේය. නමුත් අපේ රටේ පාලකයින් දැනුවත්වම වනවිනාශය සිදුකරමින් පවතින්නේ තමන්ගේ අදූරදර්ශීකම නිසාය.

1/2020 චක්‍රලේඛය එන්නේ මේ අදූරදර්ශිභාවය මොනවට විද්‍යාමාන කරමින්ය. 2020.11.04 දින වනසංරක්ෂණ ජෙනරාල්වරයා විසින් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට යවන ලද ලිපියකින් ඔහු සතුව තිබූ 05/2001 හා 02/2006, 02/02/03/301, 05/98 යන වනසංරක්ෂණ චක්‍රලේඛ සියල්ල බල රහිත බවත්, මෙරට ඇති අත්‍යවශ්‍ය අනෙකුත් වනාන්තර පිලිබඳ තීරණ ගැනීමේ අයිතිය ප්‍රා.ලේ හා දි.ලේ යන තනතුරුවලට අයිති වන බවත් සඳහන් කර ඇත. මෙලෙස එතෙක් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පැවති අත්‍යවශ්‍ය අනෙකුත් වනාන්තර 1/2020 චක්‍රලේඛය මගින් අහෝසි කර ඇත්තේ වනවිනාශයට අත වනමිනි.

මෙම "අතවශ්‍ය අනෙකුත් වනාන්තර" චක්‍රලේඛයට අනුව "අවශේෂ කැලෑ" ලෙස හුවා දක්වමින් මේ සැරසෙන්නේ අපේ රටේ 17%ක් වන වනාන්තර ප්‍රමාණයෙන් 5%ක් වන අතවශ්‍ය අනෙකුත් වනාන්තර එළිපෙහෙළි කර ඒ හා බැඳි පරිසර පද්ධතිය විනාශ කිරීමට නොවේද?.

මේවා "අවශේෂ කැලෑ" ලෙස හුවා දක්වන්නේ නොදන්නාකමටද, නැතිනම් ජනතාව ගොනාට ඇන්ඳවීමේ කෛරාටික පුරුද්ද නිසාද?. මේවා "අතවශ්‍ය අනෙකුත් වනාන්තර" ලෙස නම් කරන්නේම ඒවා පරිසර පද්ධතියට අතවශ්‍ය නිසාය. පාලකයින්ට මේ වනාන්තර පෙනෙන්නේ නිකම්ම නිකන් කටුපඳුරු වැවුණු අවශේෂ කැලෑ ලෙසය. නමුත් බොහෝ සතුන්ගේ ජනාවාස, ආහාර, ප්‍රජනනය, බිත්තර දැමීම, පැටවුන් බිහිකිරීම වැනි බොහෝ ජීවී ක්‍රියාකාරකම් සිදුවන්නේ පාලකයින් "අවශේෂ කැලෑ" ලෙස හුවාදක්වන "අතවශ්‍ය අනෙකුත් වනාන්තර" භූමි තුළය.

පාලකයින්ගේ මෙවැනි හැසිරීම් අරුමයක් නොවන්නේය. මන්ද යත් මීට පෙරද ඔවුන් හැසිරී ඇත්තේ මේ ආකාරයටමය. ඩෝසරයක නැග විල්පත්තු රක්ෂිත භූමියට අයත් වනාන්තරය ඩෝසර් කරන්නේ පරිසර ඇමතිය. පුත්තලමේ කඩොලාන විනාශකරමින් ක්‍රීඩා පිටි තනන්නේ අප මිහිතලයට වැඩිම ඔක්සිජන් ප්‍රමාණයක් නිපදවන කඩොලාන ගැන නොදන්නා ආණ්ඩුවේ ඇමතිවරයාය. සංවර්ධනය මුවාවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ තිබූ වගුරු බිම් සියල්ල ගොඩ කර දැමුවේ, වගුරු බිම් වේගයෙන් පොළොවට ජලය උරාගන්නා ස්පොන්ජ් එකක් බව ඔවුන් නොදන්නා නිසාය. අද පොඩි වැස්සට පවා කොළඹ යටවන්නේ මේ නිසාය. නමුත් අදූරදර්ශි ධනේශ්වර පාලකයින් ඒවා විනාශ කර අවසන්ය.

මෙලෙස අපේ රටේ සංවර්ධනය සිදුවන්නේ සැලසුමක් අතැතිව නොවේ. එන එන පාලකයාගේ හිතලු හා හිතුවක්කාරකම් ලෙසය. පාලකයාගේ හිතලුවලට වන්දිගෙවීමන් සිටින්නේ පරිසරයයි. වර්තමාන පාලකයාගේ " සෞභාග්‍යයේ දැක්මට" අනුව ජාතික වනවැස්ම 30%ක් දක්වා වර්ධනය කළ යුතුව තිබිණ. නමුත් පත් වූ දින සිට සිදුවූයේ රටේ පරිසර විනාශය වර්ධනය වීම පමණි.

ගල්කිස්ස වෙරළට වැලි පුරවා වෙරළ හා මුහුදු ජීවීන් විනාශ කළේය. වනාතවිල්ලුව එළුවන්කුලම අක්කර 10 කපා විනාශ කළේය. උඩවලව ජාතික වනෝද්‍යානය, තණමල්විල කෝදාගම අක්කර 10 කපා විනාශ කළේය. හම්බන්තොට එලල්ල යෝජිත අලි කලමණාකරණයේ අක්කර 150 කපා විනාශ කලේය. රැම්සා ජාත්‍යන්තර සම්මුතියට අයත් පුත්තලම ආනවිලුන්දාව අභය භූමිය ඩෝසර් කළේය. හොරොව්පතාන රත්මලේ රක්ෂිතයෙන් අක්කර 150ක් කපා විනාශ කළේය. සිංහරාජය විනාශකරමින් ලංකාගම දක්වා අව්ධිමත් මාර්ගයක් තැනුවේය.

රටේ පෙනහලු පද්ධතිය බඳු හංතාන නිම්නයෙන් අක්කර ගණනක් විනාශ කළේය. කළුවරගස්වැව තබ්බෝවේ හෙක්ටයාර් 21ක් ගල්, වැලි, පස්, දැව සඳහා විනාශ කළේය. වනාතවිල්ලුව මයිලන්කුලම විශාල වනගහණයක් වනසා දැමුවේය. දැන් දැන් මහවැලි ගඟේ මෝය කටේ සිට ඉහලට දෙපලු කරමින් ඇත්තේ වැලි ජාවාරම සඳහාය. හෝටන්තැන්නට නව මාර්ගයක් තැනීමටද සැලසුම් කරන්නේ දැවැන්ත පරිසර විනාශයකට මාන බලමින්ය.

"සෞභාග්‍යයේ දැක්ම" ක්‍රියාත්මක වන්නේ මෙලෙසින්නම්; පරිසරවේදීන්, සමාජ ක්‍රියාකාරීන්, සමහරක් දේශපාලන ව්‍යාපාර, හා පරිසර හිතකාමී ජනතාවගේ බලපෑම හා මැදිහත්වීම මත මේ දක්වා රැකගත් අපේ රටේ වන සම්පතේ විනාශය 1/2020 චක්‍රලේඛය හරහා වේගවත් වනවා නොඅනුමානය.

මෙවැනි අදූරදර්ශි පාලකයින් නිසා අද වන්දි ගෙවන්නේ පරිසරය වුවද හෙට වන්දි ගෙවීමට සිදුවන්නේ මිනිස් ජීවිතවලිනි. මන්ද යත් මේ පෘථිවි ගෝලය ඉතිරි කරගන්නේ තමාට ඉහිලිය හැකි ප්‍රමාණයක් පමණි. එය ස්වභාවික නීතියයි. ඒ නිසාවෙන් මේ අදූරදර්ශි පාලකයන්ගෙන් අපේ පරිසර පද්ධතිය රැකගැනීම අපි කාගේත් යුතුකමක් වන්නේය. මන්ද යත් අපට ජීවත්වීමට ඇත්තේ මේ පෘථිවි ගෝලය පමණක් වන නිසාවෙනි.



## The Gadget

තාක්ෂණය ගැන උනන්දු ඔයාල වෙනුවෙන්ම forward සඟරාවේ අපි හිතුවා පිටු අතරින් එහාට ගියපු අවකාශයකට ඔබම සමීප කරන්න. ඒ නිසාම මේ පිටුවෙහි පලවෙන සෑම ලිපියකටම අදාල QR code එකක් ලබාදී ඇත. දැන් ඔබගේ දුරකථනයේ QR app එක තුලින් පිටුවෙහි ඇති අදාල QR code එක scan කිරීමෙන් ඒ සඳහා පිවිසිය හැක. දුරකථනයේ QR app පහසුකම නොමැති නම් play stroe නැති නම් app store තුළින් download කරගන්න.

# SuperBoost WiFi




සුපර් බූස්ට් වයිෆයි වේගය වැඩි කරන අතරම ඔබේ වයිෆයි පරාසය පුළුල් කරයි, එයින් අදහස් වන්නේ වෙන කවරදාකටත් වඩා ඔබේ සම්බන්ධතාවය වේගවත් බවයි. එය ඕනෑම මොඩමයක් සමඟ ක්‍රියා කරයි. කරදර නොවන්න, එය 100% නීතිමය ය.

විඩියෝව සඳහා පිවිසෙන්න

# Xdrill

ලොව පළමු ඩිජිටල් ස්මාර්ට් xDrill රැහැන් රහිත උපාංග තුලින් ඔබේ වටිනා කාලය ඉතිරි කරගත්ත හැක. ස්මාර්ට් විශේෂාංග, ඒකාබද්ධ මෙවලම් සහ උසස් පාලක ඇතුළත් වේ. එහි ස්පර්ශක තිරයක්, බ්ලූටූත් පාලක හා තවත් අංග රාශියකින් යුක්තව පවතී.



විඩියෝව සඳහා පිවිසෙන්න

# මාලු ඇල්ලීමේ කලාව Gofish cam



මසුන් ඇල්ලීම ලොව පුරා විනෝදාත්මක හා ප්‍රතිලාභ ගෙන දෙන ක්‍රීඩාවකි. ඔබ විනෝදයක් ලෙස හෝ නිතර නිතර මසුන් ඇල්ලුවද, හොඳම උපකරණ තිබීම අතිශයින්ම වැදගත්ය. ගොෆිෂ් කැම් යනු රැහැන් රහිත දිය යට කැමරාවක් වන අතර එමඟින් මසුන් ඇල්ලීම වඩාත් විනෝදජනක වේ.

විඩියෝව සඳහා පිවිසෙන්න

# නැනෝ තාක්ෂණයෙන් පරිපූර්ණ බෑගය

## Nanobag 4.0



ඔබ ශොපිං කරන විට විශාල බෑගයක් මතුවට රැගෙන යා යුතු නැත.ඒ සදහා අවශ්‍ය වන්නේ ඔබේ මුදල් පසුම්බියෙහි දමා ගත හැකි මෙම නව Nanobag 4.0 යයි. එය ඔබට අවශ්‍ය වන සෑම මොහොතකම විශාල බෑගයක් බවට පරිවර්තනය වන්නේ ඔබවද මවිතයට පත්කරමිනි.

විඩියෝව සඳහා පිවිසෙන්න

# Blaux Personal



ඔබගේ දෛනික ගමනාගමනය සඳහා පුදුමාකාර නිෂ්පාදනයක්. ජනාකීර්ණ අවස්ථාවන්හිදී පවා එය ඔබව සිසිල් සහ පිරිසිදු වාතය ආශ්වාස කරනු ඇත.

විඩියෝව සඳහා පිවිසෙන්න

# AI-Equipped Smart Bag

ස්ටීල්ත් ස්මාර්ට් බෑග් යනු නගර වීදිවල සිටින විට ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා මාර්ගයක් සොයන මගීන්, උද්‍යෝගිමත් සංචාරකයින් සහ නාගරිකයන් සඳහා වන උපාංගයකි. මෙම බෑග් සෑම එකක්ම යුගලනය කර ඇත්තේ කෘතිම බුද්ධි (AI) කැමරාවක් සමඟ වන අතර එමඟින් පරිශීලකයා වටා සැඟවී ඇති අන්තරායන් නිරීක්ෂණය කිරීම සඳහා උනන්දුවෙන් ක්‍රියා කරනු ඇත.



විඩියෝව සඳහා පිවිසෙන්න

# SterilizeX



අනෙකුත් සනීපාරක්ෂක නිෂ්පාදන මෙන් නොව, කිසිදු අපද්‍රව්‍යයක් ඉතිරි නොකරයි, එසේම එය භාවිතා කිරීමට කිසිදු විශේෂිත උත්සාහයක් අවශ්‍ය නොවේ! එය සක්‍රිය කර කාමරයෙන් පිටව යන්න. මෙම සනීපාරක්ෂක උපකරණය මඟින් වාතයේ ඇති බැක්ටීරියා සහ විෂබීජ අතුගා දමනු ඇත, එමඟින් ඔබ සහ ඔබේ පවුලේ අය ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න වීමට උපකාරී වේ.

විඩියෝව සඳහා පිවිසෙන්න

# Mask Sanitation Appliances



පරිශීලකයින්ට ඔවුන්ගේ මුහුණු ආවරණ පිරිසිදුව හා රෝගකාරක වලින් තොරව තබා ගත හැකිය. සැඟවී ඇති සියලුම විෂබීජ, බැක්ටීරියා සහ වෛරස් තුරන් කරයි. දූවිලි හෝ අංශු

ද්‍රව්‍ය කොපමණ දැයි හඳුනාගැනීම සදහා විශේෂිත උපකරණයකින්ද සමන්විතය.

# ලෙඩ ආර්ථිකයක් තුළ කොරෝනා හමුවේ හුස්ම යදින මිනිස්සු!

අප මේ ගෙවමින් සිටිනුයේ ධනවාදය ඉතිහාසයේ අන් කවරදාටත් වඩා දැඩිව අර්බුදයට ගිය කාල පරිච්ඡේදයකි. පියෙවි ඇසට නොපෙනෙන වෛරසයක් වසරකට ආසන්න කාලයක් ධනවාදයේ පතාක යෝධයන් වන ඇමරිකාව, එංගලන්තය, ඉතාලිය වැනි රටවල් දණ



ගස්වා ඇත. මෙම ගෝලීය වසංගතය හමුවේ වඩාත් අර්බුදයට පත්ව ඇත්තේ අප වැනි තෙවන ලෝකයේ රටවල්ය. කොවිඩ් 19 මෙරට ව්‍යාප්තිය ආරම්භ වූ මාර්තු මාසයේ සිට මේ වන තෙක් කාලය තුළ වඩාත් පීඩාවට ලක් වූ සමාජ කණ්ඩායම් පිළිබඳ විමසා බැලීම මෙම ලිපියේ අරමුණ වේ.

ලොව පුරා පොදුවේ පැතිරී ඇති ධනවාදයේ අසාර්ථකත්වය මෙන්ම අප වැනි රටවල දේශපාලන නායකත්වයේ අදූරදර්ශී අත්තනෝමතික පාලනය හමුවේ වඩාත් අසරණභාවයට පත්ව ඇත්තේ එදිනෙදා කුලී වැඩ කරන මිනිසුන්, ඇඟලුම් සේවක සේවිකාවන්, ධීවරයින්, කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්, මෑන් පවර් සේවක සේවිකාවන්, ලිංගික ශ්‍රමිකයන්, එළවලු, පළතුරු හා මාළු වෙළඳාමේ නිරතවන්නන්, සංචාරක ව්‍යාපාරයේ නිරතවන්නන් වැනි පිරිස්ය. නිශ්චිත සංඛ්‍යාලේඛන කිසිවක් මේ වන තෙක් ලබාගෙන නොමැති වුවද පසුගිය මාර්තු මාසයේ සිට මේ වන තෙක් ඉහත පිරිස්වලට අමතරව පෞද්ගලික අංශයේ රැකියා අහිමි වූ පිරිස 500,000කට ආසන්න බවට විශ්වාස කෙරේ.

විශේෂයෙන්ම දෙවන කොරෝනා රැල්ල ආරම්භයත් සමඟ වඩාත් බලපෑමට ලක්වූයේ ඇඟලුම් සේවක සේවිකාවන්ය. මන්ද දෙවන රැල්ල තුළ වැඩිම ආසාදිතයන් ප්‍රමාණය ඔවුන් වූ බැවිනි. මේ හේතුවෙන් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ මෙන්ම දිවයින පුරා ස්ථාන කිහිපයක ඇඟලුම් කර්මාන්ත ශාලා ගණනාවක් වසා දැමීම සිදුවිය. පාලනාධිකාරියේ ලාභය පමණක් අරමුණු කරගත් අත්තනෝමතික ක්‍රියාකලාපය හේතුවෙන් අවසානයේ පීඩාවට පත්වූයේ ඒවායේ සේවක සේවිකාවන්ය. විශේෂයෙන්ම මෙම ගෝලීය වසංගත තත්වයට මුවාවෙන් මාර්තු මාසයේ සිට ඔවුන්ගේ වැටුප් අඩකින් කපා දැමුණු අතර අනෙකුත් දීමනාද කපාහරින ලදී. මාර්තු මාසයේ රටපුරා ඇඳිරිනීතිය පැනවීමත් සමඟ නිදහස් වෙළඳකලාපයේ සේවක සේවිකාවන් සිය ගම්බිම්වලට යාමට නොහැකිව නවාතැන්වල සිරවූයේ කෑමබීම හෝ නොමැතිවය. පසුව ඉන් පිරිසකට පමණක් ගම්බිම්වලට යාමට අවස්ථාව ලබාදෙන ලද්දේ විවිධ සංවිධානවලින්ද එල්ල වූ බලපෑම හේතුවෙනි. මෙවර එම තත්වය වඩාත් තීව්‍ර වී ඇත්තේ ඔවුන් විශාල පිරිසක් සහ ඔවුන්ගේ ආශ්‍රිතයන් විශාල පිරිසක්ද ආසාදිතයන් වීම හේතුවෙනි. දෙවන රැල්ල ආරම්භයේ ආසාදිත බවට පළමුව හමු වූ ඇඟලුම් සේවිකාව පමණක් නොව ඇගේ පවුලේ සාමාජිකයන්ටද දැඩි අවලාද හා දුෂ්කරතාවයන්ට මුහුණදෙන්නට සිදුවිය. විශේෂයෙන්ම ආසාදිත ඇඟලුම් සේවිකාවන් ලිංගික ශ්‍රමිකයෙක් ලෙසට නාමකරණය කරමින් ඔවුන් අපහසුතාවයට පත් කරන ලදී. එමෙන්ම ඔවුන් බොහෝදෙනෙකුට නවාතැන්වලින් ඉවත්ව යන ලෙස බලපෑම් සිදුකරන ලදී. ඇඳිරිනීතිය පැනවීමත් සමඟ ඔවුන් බොහෝදෙනෙකුට ආහාරපාන හෝ නොමැතිව දැඩි දුෂ්කරතාවයට මුහුණදීමට සිදුවිය. කුඩා දරුවන් සිටින සහ ගර්භනී සේවිකාවන් වඩාත් දුෂ්කරතාවයට පත්ව ඇත. නිෂ්පාදන පහතවැටීම හේතුවෙන් වැටුපෙන් අඩක් පමණක් ගෙවනු ලැබූවද ආසාදිත සහ නිරෝධායනයට ලක්කර ඇති සේවක සේවිකාවන්ගේ ඇතමෙක්ට මේ වන තෙක් තම අඩ වැටුපද නොලැබී ඇති අතර සේවයට නොපැමිණීම හේතුවෙන් වැටුප් කපා ඇත.

මේ වන විට ඇතැම් ඇඟළුම්හල් නේවාසිකාගාර පවත්වාගනිමින් ඒවායේ නැවතීමට එකඟ සේවක සේවිකාවන්ට පමණක් සේවයට පැමිණීමට ඉඩ ලබාදෙන අතර එම පහසුකම ලබාදෙනුයේ එක් අයෙකුට පමණක් වන බැවින් විවාහක සේවක සේවිකාවන්ට රැකියා අහිමිවීමේ අවධානමකට ලක්වී ඇත. එසේ නොමැති නම් තමන් වෙසෙන නවාතැනේ තමන්ට වෙන්වූ නාන කාමර පහසුකම් සහිතව තිබෙන බව පෙන්වා දිය යුතුව ඇත. මෙය සෞඛ්‍ය නිර්දේශය වී ඇත්තේ අවම වශයෙන් 25 දෙනෙකුටවත් නාන කාමරයක් තිබිය යුතු බව දක්වා තිබුණද එය ප්‍රායෝගිකව සිදුනොවන්නක් වන අතර එම නවාතැන් විෂබීජහරණයට ලක්නොවීම හේතුවෙන් නැවත වෛරසය පැතිරීයාමේ අවදානම මතුවී ඇත. එමෙන්ම දිනකට 1%ක අහඹු පරීක්ෂණ සිදුකළ යුතු බව දක්වා තිබුණද සිදුවනුයේ දින 5කට පසු 5%ක පරීක්ෂණ සිදුකිරීමය.

දෙවන කොරෝනා රැල්ලේ දෙවන පොකුර පෑලියගොඩ මාළු වෙළඳ සංකීර්ණයේ හරහා මතුවීම තුළ සුළු ධීවර ප්‍රජාවද දැඩි දුෂ්කරතාවයකට ලක්වූයේ සාමාන්‍ය ජනතාව මාළු පරිභෝජනයට බියවීම නිසා තම මාළු අස්වැන්න අලෙවි කරගැනීමට නොහැකි වීමෙනි. මේ හේතුවෙන් මාළු කිලෝ ලක්ෂ ගණනක් විනාශ වූයේ ආණ්ඩුව ඊට පිළියමක් යෙදීමට අසමත්වීම හේතුවෙනි. එමෙන්ම ඇතැම් අවස්ථාවල ඇතැම් ධීවරයන්ගේ PCR පරීක්ෂණ වාර්තා බෙහෙවින් ප්‍රමාදවීම හේතුවෙන් ඇතැම් ධීවරයන් මුහුදු ගොස් සිටියදී නැවත බෝට්ටු හරවාගෙන ඒමට සිදුවූ අතර අනෙකුත් ධීවරයන්ටද වෛරසය ආසාදනය වීමට එය හේතු විය.

එසේම පසුගිය වර මෙන්ම මෙවරද ආණ්ඩුවට නිසි වැඩපිළිවෙලක් නැතිවීම හේතුවෙන් එළවළු සහ පළතුරු අස්වැන්න විශාල වශයෙන් විකුණාගැනීමට නොහැකි වී විනාශ වී ගොවීන් අසරණ වූ අතර කුලී කම්කරුවන් සහ මෑන් පවර් සේවක සේවිකාවන් ලිංගික ශ්‍රමිකයන්ද රැකියා අවස්ථා අහිමිවීම හේතුවෙන් දැඩි අසරණ භාවයට පත්ව සිටී. අනෙක් පසින් දැඩිව පීඩාවට පත්ව සිටින්නේ සංචාරක ව්‍යාපාරයේ නියැලුණු පිරිස්ය. මෙම බොහෝමයක් පිරිස් සඳහා රුපියල් පන්දහසක දීමනාවක් ලබාදුන්නද එය හිමිවන්නේ ස්ථිර පදිංචිකරුවන්ට පමණක් වන බැවින් ඇඟළුම් සේවකයින් වැනි වෙනත් ප්‍රදේශවල තාවකාලිකව නැවතී රැකියා කළ පිරිස් තවත් අසීරුතාවයට පත්ව ඇත. මේ සියළු තත්වයන් නැවත නැවතත් තහවුරු කර සිටිනුයේ ධනවාදයේ මෙන්ම මෙරට පාලකයන්ගේද අසමත්භාවයය. මෙම ක්‍රමය වෙනස් කිරීමට මෙයට වඩා තවත් හේතු නොවුවමනාය!.

# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සුදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com

## යෝධයාගේ සිත්තම

සුදු බ්‍රෝවින් පිටු පුරවා ළමුන් ඇඳපු චිත්‍ර අතර
වේළුසුමන, දීඝජන්තු, කහපාටින් නන්දිමිත්‍ර..
තෙල් සායම් නැවක ගිලී ලිලිප්ට්ටන් මැද ගලිවර
නම නොදන්න තවත් එකෙකි බෝංචි මායා කෙළවර....

හතරට නැමූ මගෙ චිත්‍රය ටීචර් ගත් විට බලන්න
ඔලොක්කුවට හිනාවෙලා සැරසුණෙ ටොක්කක් අනින්න..
පැස්ටල් ඉල්ලන්නෙ කොහොම, එපා ළමුනි හිනාවෙන්න
රෑ තුන් යම කෙඳිරිගාන වළලු කරෙන් දුක අහන්න....

කුරුම්බැට්ටියක පපුවේ වැහුණේ නැති හිල වහන්න
කණාටු ගෙඩියක ඇදුමට හති පෙති ටික කඩෙන් ගන්න
කුරවල් වුණ වැවරයට හෙට දින දැවැදි හොයන්න
ඔය එක යෝධයෙක්ට බෑ ගස් සීයක් බඩගාන්න....

නිමල්ගෙ පොත හොරෙන් ඉරා ගත් ඒ සුදු කොළ ඇබින්ද
පාටකරේ අඟුරු කැටෙන් මං ලිප් බොක්කෙන් ඇහින්ද
යෝධයින්ට කෙට්ටු පපුව, දැලි අතපය ඔට්ටු නැද්ද?
බුදු තාත්තෙ උඹ ඇරුණම වෙන යෝධයො මට කොහින්ද?....

] පවන් ශාමික [

## අභිනික්මණ

නින්ද නොදුටු ඇස් අගට
කියමි ඉවසපං ගැහැට!
වැස්සක් නැති දාට
තරු හිනැහෙයි රෑට....
පුරහඳ කවදා
පායයිදෝ අපේ පැලට?
වැස්සක් වැහිය යුතුමය
මේ ගිණියමට!
හවුවක් නැතිව
වැස්සෙන්
මොන සතුටක්ද?
අස්සක් නැර පපුවේ ලියූ
පෙම් කවිය..
පුස්සක් කරං තබනෙමි
පියවර පෙරට....

] යශෝධා සමරධීර [

## ජීවිතය

රෑ පුරා
පෙම් හීන අතුරමි..
උදෑසන
වවුල් හප ඇහිදිමි..

] ඉමල්ෂ උමයංගන [

## කුජනු කල වනු!

හුස්ම ගන්නා
පෙනහළු..
එක්කෝ, දෙමළය..?
නොහොත්,
මුස්ලිම්ය..?
නැතොත්,
සිංහලය..?

] බුද්ධික සම්පත් [

## පරණ පිටු

ඒ දවස් වල
කුටියට වැටුණ
ඉර එළිය පවා පරණයි
පරණ සුවඳයි
ඒ කාලෙ මතකත්
පිටු මැදින් හමාපු..

'රස්කොල්නිකව්'
අමාරුවෙන් කියවගත්තෙ
දිවත් පැටලෙද්දි
ටික වෙලාවක් හිටිය මතකයි
පොත වහන් ඇස් පියන්..

උඹ නම් පිස්සෙක්
දොස්තියෙව්ස්කිත් පුදුම මිනිහෙක්
කෝම තනනවද
මේ තරම් අමුතු මිනිස් හිත්!

ඒ ජීවිතෙත්
මතකයක් දැන්
පුදුමයි.. සුවඳයි..
මැවෙනව ගොඩක් ඇතින්
පරණ තාලෙට
මගෙ පිස්සු හිතළු...

ෂෝලහොව් වගෙම ගෝර්කිත්
ලිව්ව අකුරුවල තීන්ත
මුහු වෙච්ච
දොන් නදිය වොල්ගාව
ගලා ගිය පාරවල්
මගෙ පපුව හැමතැනම..!

අලෝෂා මියැදෙද්දි
ළග ඉන්න බැරි වෙච්ච සෝකෙන්
හැංගිලා අඬනකොට..
කාටවත් නැහුන
ආදරෙත්
දැන් ඉතින් පරණයි...

] සඳුනි නුවන්තිකා [



# එක්සත් ජනපද ජනාධිපතිවරණය සහ අපේ හෙට දවස

ඇමරිකානු ජනාධිපතිවරණය පිළිබඳව කතාබහ තරමක් පමා වී තිබුණත් මේ මොහොතේත් අපට ඒ පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීම ඉතා වැදගත්. මොකද ඇමරිකානු ජනාධිපතිවරණය කියලා කියන්නේ ලෝකයටත් සමස්ත වමේ ව්‍යාපාරයටත් අධිරාජ්‍යවාදය පිළිබඳව යම් ප්‍රබල පාඩමක් කියා දෙන තැනක්. ඒ නිසා සමස්තය පිළිබඳව නොවුණත් මේ මොහොතේදී ඇමරිකානු ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ජනතාව තුළ තැන්පත්ව ඇති යම් අදහස් කීපයක් පිළිබඳව විමසාබැලීමක් සිදුකිරීම වටිනවා.

පළමුවෙන්ම අපි කවුරුත් තේරුම්ගන්න ඕන එක් සත්‍යයක් තමයි ඇමරිකා එක්සත් ජනපදය තුළ එහි ඇමරිකානුවන් තමන්ට ජනාධිපතිවරයෙක් තෝරාගැනීම සඳහා සිය ඡන්දය භාවිතා කළත් එහි සැබෑ පෙරටුගාමී කාර්යයභාරයේ නියැළෙන්නේ විශාල බහුජාතික සමාගම් කිහිපයක් බව. මොකද ඇමරිකානු ජනාධිපතිවරණය කියලා කියන්නේම විශාල මුදල් සම්භාරයක සූදුවක් වගෙයි. ජනමතය විකෘති කරවමින් සල්ලි වැඩිපුර වියදම් කරන කෙනාට දිනන්න අවස්ථාව හිමිවෙනවා. ලෝකයේ තිබෙන විශාලතම සමාගම් සමූහයක් තමන්ගේ මුදල් පොම්පකරමින් තමන්ට වඩාත් ගැළපෙන ජනාධිපතිවරයෙක් පත් කරගන්නට ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිවරණය තුළ උත්සාහ දරනවා. මෙවර එහි ජනපති අපේක්ෂකයින්ගේ නිල වියදම පමණක් ඇමරිකානු ඩොලර් බිලියන 6.7 කට ආසන්න බව ගණන් බලා තිබෙනවා.

කොහොම නමුත් මෙවර ඇමරිකානු ජනාධිපතිවරණය අවසානයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් මිලියන 74කට ආසන්න ඡන්ද ප්‍රමාණයකුත් ජෝ බයිඩන් විසින් මිලියන 81කට ආසන්න ඡන්ද ප්‍රමාණයකුත් ලබා ගන්නවා. ඒ අනුව එක්සත් ජනපදය තුළ හැමදාමත් පැවති රිපබ්ලිකන්වරුන්ගේ හා ඩිමොක්‍රටික්වරුන්ගේ තට්ටුමාරු පාලනයේ මෙවර අවස්ථාව දිනාගත්තේ ඩිමොක්‍රටික් පක්ෂය නියෝජනය කළ ජෝ බයිඩන් විසිනුයි.

ඉතින් මේ ප්‍රතිඵලය දිහා බලලා කෙනෙක්ට මෙහෙම හිතෙන්න පුළුවන්.

"කවුරු දින්නත් කමක් නැහැ, ට්‍රම්ප් පැරදිලා."

"ට්‍රම්ප්ගෙ කාලෙ වගේ නෙවෙයි, දැන් ඉතින් ඇමරිකාව අපි වගේ රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වෙන එක අඩු කරයි."

ඒත් ඔබ හිතනවාද ඔබට ඔය දකින සිහිනයේ වැඩි කලක් ජීවත්වීමට ලැබේවියි කියා. කොහොම නමුත් තවමත් එහෙම හිතෙනවා නම් මේ මොහොතේදිත් ඒක මිරිඟුවක් විතරයි කියලා කණගාටුවෙන් වුණත් ඔබ තේරුම්ගත යුතුයි. නිකන්ම නොවෙයි, ඇමරිකානු ඉතිහාසය පුරා තිබෙන අධිරාජ්‍යවාදී අන්ධකාරය දෙස හොඳින් බලන්න. කාලානුරූපීව ක්‍රමක්‍රමයෙන් ඒ අන්ධකාරය විසින් ලොව පුරා රටවල් මෙන්ම තමන්ගේම රටේ දුප්පත් ඇමරිකානුවන්ගේත් ජීවිත හා ශ්‍රමය සූරා කාපු හැටි, සියල්ල වටා තමන්ගෙ ආධිපත්‍යය පතුරවපු හැටි වගේම ආර්ථිකමය වශයෙන්, දේශපාලනමය හා යුධමය වශයෙන්, විද්‍යාව හා තාක්ෂණයෙන් මෙන්ම සංස්කෘතිකවත් ඉහළින්ම වැජඹෙන්න කරපු දැවැන්ත අධිරාජ්‍යවාදී අතපෙවීම්වල අඳුරු ඉතිහාසයත් වර්තමානයත් ඔබට පෙනේවි. ඇමරිකා එක්සත් ජනපදයේ මේ විනාශකාරී, අධිරාජ්‍යවාදී ගමන තුළ ඔවුන් විසින් පත් කරගත් සෑම රාජ්‍ය නායකයෙකුගේම පා සටහන් තිබෙනවා. වෙනසකට ඇත්තේ ඒවායේ හැඩය සහ ගැඹුර පමණි. එසේ



නොවන්නට ඒ අඩි සලකුණු සියල්ලම පාහේ වැටී ඇත්තේ අවවරප්‍රසාදිත හා පීඩිත වූ දුප්පත් ඇමරිකානුවන්ගේත්, ලොව පුරා පිහිටි එහි අණසකට නතු වූ රටවල පීඩිත ජනතාවගේත් හිස් මතිනුයි.

ට්‍රම්ප් වැනි උග්‍ර ජාතිවාදී, වර්ගවාදී වගේම පරිසර විරෝධී උද්දච්ච මිනිහෙකුට ඇ.එ.ජනපදය තුළ ජනාධිපතිවරයෙක් වීමට පාර කැපූයේ කුමක් විසින්දැයි කියා ඔබ නිකමටවත් කල්පනා කර බැලුවාද? ඔබ දන්නවා මිනිසුන් දේශපාලනයේදී පරාජය වුවහොත් පසු කලෙකදී හෝ එයින් පාඩම් ඉගෙන ගන්නවා. නමුත් දේශපාලනිකව පාවාදීම්වලට ගොදුරු වූවාම ඔවුන් බරපතල ලෙස දේශපාලනය අත්හරිනවා. ඒ නිසා ඩිමොක්‍රටික් පක්ෂය ප්‍රමුඛ අවුරුදු 08ක ඔබාමා පාලනය තුළ තිබූ බොරුව, ජනමතය පාවාදීම් හා සුවහසක් ඇමරිකානුවන්ගේ බලාපොරොත්තු ඉටුකිරීමට අපොහොසත් වීම නිසා තමයි ට්‍රම්ප් වැන්නෙකුට අවස්ථාවක් හිමි වූයේ.

ඔබට මතක ඇති, ඇ.එ. ජනපදයේ පළමු කළු ජාතික ජනාධිපතිවරයා ලෙස බැරක් ඔබාමා විසින් විප්ලවීය වෙනසක් සිදු කරාවි යැයි සමහරු සිතුවත් එය එසේ වූයේ නැහැ. ඔබාමා විසින් පරිසරය රකින්න, කළු ජාතිකයින්ගේ ජීවිත උසස් තලයකට ගෙන යන්නට මෙන්ම ලෝක ආර්ථික අවපාතයෙන් පසුව ඇති වූ ආර්ථික දුෂ්කරතාවන්ගෙන් සිය ජනතාව මුදාගන්නට දුන් පොරොන්දු සියල්ල එලක් නැති හිස් වචන පමණක් වී තිබුණා. ඔහුගේ පාලන සමයේදීත් සුපුරුදු ලෙසම ඇමරිකාව විසින් රටවල් යටත් කර ගැනීමටත්, ඒවායේ ස්වෛරීත්වයට ඇඟිලි ගැසීමටත් මෙන්ම මානව සමාජයේ පොදු යහපත පසෙකලා සමාගම්වල ලාබ අරමුණු වෙනුවෙන් ලොව පුරා ජනතාවගේ ලේ මාංශ උරා බොන්නටත් කටයුතු කළා.

එවැනි පසුබිමක් යටතේ බලයට පත් වූ ඩොනල්ඩ් ට්‍රම්ප් අද පරාජය වුවත් ඔහුගේ මතයට කලින්ට වඩා ඉඩක් නිර්මාණය වී තිබෙනවා. මෙවර ප්‍රතිඵල දෙස හොඳින් බැලුවහොත් ඔබට එය වැටහේවි. ට්‍රම්ප් ගියවර ලබාගත්තාට වඩා මෙවර ඡන්ද මිලියන 12ක් පමණ වැඩියෙන් ලබා තිබෙනවා. එසේම මෙවර ඔහු එවැනි ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නේ කොරෝනා පාලනයේ අසමත්භාවයත්, සාතිශය බහුතරයක් වන ඇමරිකානුවන් අතර පවතින උග්‍ර දරිද්‍රතාවයත්, විරැකියා අර්බුදයත් මෙන්ම ෆ්‍රොයිඩ් ඝාතනය නිසා ඇති වූ දැවැන්ත ජනතා අරගලයත් ආදී නොයෙක් දෑ මධ්‍යයේයි. අනෙක් අතට ට්‍රම්ප්ට පවා මෙවරත් සුදු මෙන්ම කළු, ලතින් හා ආසියානු සම්භවයක් සහිත ඇමරිකානුවන් මෙන්ම වාර්ෂික ආදායම ඇ.ඩොලර් 50,000ට අඩු ජනතාවගේ පටන් ඉතා ඉහළම ආදායම් ලබන පුද්ගලයින් දක්වාමත් ග්‍රාමීය හෝ නාගරික භේදයකින් තොරව සිය ඡන්දය ප්‍රකාශ කොට තිබුණා. ඒ නිසා ට්‍රම්ප්ව ගෙදර යැවුවත් ඔහුගේ මතවාදය පිළිගන්න සූදානම් සැලකිය යුතු තරමේ මිනිසුන් ප්‍රමාණයක් තවමත් සිටින බව ඉතා පැහැදිලියි.

ඒ නිසා ඔන්න දැන් අවස්ථාව හිමි වෙනවා ට්‍රම්ප්ට වඩා කදිමට අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය දිගහැරිය හැකි "smart ජාතිවාදියෙක්ට", "smart වර්ගවාදියෙක්ට", "smart පරිසර විරෝධියෙක්ට". ජෝ බයිඩන්ට හිමිව ඇත්තේ ඒ අවස්ථාවයි. අනෙක ධනවාදය හෝ අධිරාජ්‍යවාදය ක්‍රියාත්මක වන්නේ පුද්ගල සාධක මත පමණක්ම නෙවෙයි. ලෝකය අල්ලේ නටවන්නට සමත් විශාල බහුජාතික සමාගම්වලට අවශ්‍ය වන්නේ පරිසර ප්‍රතිපත්ති හා මානව ප්‍රේමය ආදිය කීතු කීතු කර දමමින් තම ලාබය තරකර ගැනීමට සමත් ප්‍රතිපත්ති සැකසිය හැකි පාලනයක් හා වැඩපිළිවෙළක් පමණයි. ඉදින් අවුරුදු 50ක් පුරා ඇමරිකාවට එහි අධිරාජ්‍යවාදී ගමන සාර්ථක කරගන්න සෙනෙට් මණ්ඩල සභිකයෙක් ලෙසත් උප ජනාධිපතිවරයෙක් ලෙසත් සේවය කළ ජෝ බයිඩන්ට එය පහසු වනු ඇති.

කොහොම වුණත් මේ ප්‍රතිඵලයෙන් පස්සෙ එක දෙයක් පැහැදිලියි. ඒ තමයි, ඇමරිකානුවන් විසින් නරක පරදවන්නට සමත් වූවත් හොඳම දේ තෝරාගැනීමට අපොහොසත් වී තිබෙනවා බව. ඒ නිසා ලෝක ඉතිහාසය තුළ දැවැන්ත අරගලවලට දායකවෙමින් කටයුතු කළ වීරෝදාර මිනිසුන්ගේද ඉතිහාසයකට උරුමකම් කියන ඇමරිකාව තුළ යළිත් ස්ථිර ලෙසම නරක පරදා හොඳ දිනවීමට සමත් ශක්තිමත් වමේ ව්‍යාපාරයක අවශ්‍යතාව ඇමරිකානුවනි ඔබට මෙන්ම අපටද දැනේ..!

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.